පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීමේදී පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම
அரச தொழில்முயற்சிகளைத் தனியார்மயமாக்கும்போது விரிவான ஆய்வொன்றை மேற்கொள்ளல்
COMPREHENSIVE STUDY WHEN PRIVATIZING PUBLIC ENTERPRISES

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය නමින් රජය විසින් ලාභ ලබන රාජ්‍ය ව්‍යවසාය කිහිපයක් ශීඝ්‍ර පෞද්ගලීකරණයකට ලක් කිරීමට කටයුතු කරමින් සිටිනවා. ඒ සඳහා මේ වන විට තෝරා ගෙන ඇති ආයතන ලැයිස්තුවේ ප්‍රමුඛතම ආයතන තුනක් වන්නේ, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ ලිට්‍රෝ ගෑස් ආයතනය යි.

රාජ්‍ය ව්‍යවසාය පවතින්නේ ලාභ ලැබීමේ අරමුණින් පමණක් නොවෙයි. එම ව්‍යාපාර ජාතික ආරක්ෂාව සමඟ බැඳී තිබීම, දීර්ඝ කාලීන ආර්ථික ප්‍රතිලාභ තිබීම, සමාජ සාධාරණත්වය හා සමාජ සුබසාධනය තහවුරු කිරීම, වෙළෙඳ පොළ ස්ථායීකරණය හා වෙළෙඳ පොළ තුළ අහිතකර ඒකාධිකාරයක් ඇති වීම වැළැක්වීම යනාදිය රජය එම ව්‍යාපාර කිරීමේ අරමුණු වේ.

අපි පිළිගන්නවා, මේ රටේ පාඩු ලබන යම් යම් රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීම අවශ්‍යයි කියන එක. මේ පාඩු ලබන ව්‍යාපාරවලට කොන්දේසි විරහිතව මුදල් පොම්ප කරන්නට මේ රටේ බදු ගෙවන්නන්ට හැකියාවක් නැහැ. එ් වාගේම, ඉහත සඳහන් හේතු, කරුණු කාරණා ඔළුවට අරගෙන මේ ප්‍රතිව්‍යුහගත කිරීමේ - ප්‍රතිසංස්කරණය කිරීමේ - ක්‍රියාවලිය දිහා බලන්නට අපට සිදු වෙනවා. එතැනදී ලාභ ලබන ව්‍යාපාර පෞද්ගලීකරණය කිරීම පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා.

අකාර්යක්ෂම වීම හෝ රජයට තවදුරටත් වෙළෙඳ පොළ තරගකාරීත්වයට මුහුණ දීමට නොහැකි වීම හෝ කෙටි කාලීන අරමුදල් සපයා ගැනීමේ අරමුණින් හෝ රජය විසින් යම් රජයේ ආයතනයක් පෞද්ගලීකරණය කරන්නේ නම් එමඟින් ලැබෙන කෙටි කාලීන මුදල ගැන පමණක් නොව පෞද්ගලීකරණය නිසා ඉහතින් සඳහන් කළ සියලු කරුණු කෙරෙහි වන බලපෑම් ගැන ද ගැඹුරු අධ්‍යයනයක් කළ යුතු වෙනවා.

ඉහත අධ්‍යයනය කළේ ද යන්න දැන ගැනීමට මහජනතාවට මෙන්ම පාර්ලිමේන්තුවට ද අයිතියක් තිබෙනවා. එය එම ආයතනවල සේවය කරන නිලධාරීන් ඇතුළු සේවයකයන්ගේ අයිතියක් වෙනවා. මේ පිළිබඳව මා කීප වරක්ම ප්‍රශ්න නැඟුවත් ඒ ප්‍රශ්නවලට පිළිතුරු ලබා නොදුන් හෙයින් සහ ඇතැම් පිළිතුරු ප්‍රමාණවත් නොවූ හෙයින් මම මේ ප්‍රශ්න ටික ඉදිරිපත් කරනවා.

01. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව කොපමණ කාලයක් පෞද්ගලික අංශයට පවරා තිබුණේ ද? එම කාලය තුළ එක් එක් වසරවලදී ලැබූ ලාභ, අලාභ කවරේද? එය යළිත් වරක් රජයට පවරා ගැනුණේ කුමන වසරේදී ද? එසේ පවරා ගැනීමෙන් පසුව එම එක් එක් වසරවලදී කොපමණ ලාභ, අලාභ වාර්තා කර ඇත් ද?

02. රජය පෞද්ගලීකරණයට සැරසෙන්නේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පමණක් ද? නැතහොත්, එහි පාලිත සමාගම් ද ප්‍රතිව්‍යුහගත කරන්නේ ද? එසේ ප්‍රතිව්‍යුහගත හෝ පෞද්ගලීකරණය කරනු ලබන පාලිත සමාගම් අතරට ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම ද ඇතුළත් වන්නේ ද? නො එසේ නම්, ප්‍රතිව්‍යුහගත කරනු ලබන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු අනෙකුත් පාලිත සමාගම් මොනවාද? ඒ සඳහා පදනම් වූ කරුණු කවරේද? මේ සම්බන්ධයෙන් රජය පූර්ව අධ්‍යයනයක් කරන ලද්දේද? එසේ අධ්‍යයනයක් කළා නම්, එම වාර්තා සභාගත කරන්නේද?

03. ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා සමාගම පසුගිය වසර 5 තුළ ලැබූ ලාභ, අලාභ පිළිබඳ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කළ හැකි ද? මෙම සමාගම් විසින් පසුගිය වසර 5 තුළදී රජයට ගෙවනු ලැබූ බදු ප්‍රමාණය කවරේද?

ගරු ශෙහාන් සේමසිංහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමනි, World Bank එකෙන් දීලා තිබෙනවා, ඩොලර් මිලියන ගණනාවක්, විශේෂයෙන්ම gas suppliesවලට පහසුකම් සපයන්න. අපට ආරංචියි, World Bank එක ගෑස් ලබා ගැනීමට ලබා දුන්නු ඒ loan component එකට අදාළ මුදල මාස කිහිපයක් ඇතුළත ආපහු ගෙවීමටත් ලිට්‍රෝ ගෑස් සමාගම සමත් වුණා කියලා. ඒ කාරණාව සත්‍ය ද, අසත්‍ය ද කියන කාරණයත් ඔබතුමාගේ පිළිතුරේදී සඳහන් කරන්න.

04. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද? පෞද්ගලික අංශය සතු කොටස් ප්‍රමාණය කොපමණද? එය කොපමණ ප්‍රතිශතයක් ද? එම කොටස් හිමි පෞද්ගලික ආයතන මොනවාද? 2022 වසරේදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ලාභ නොලද්දේ ද? නො එසේ නම්, ලැබූ අලාභය හෝ ලාභය කොපමණද? පසුගිය වසරේ ටෙලිකොම් ආයතනය රජයේ භාණ්ඩාගාරයට ගෙවූ සමස්ත බදු ප්‍රමාණය කොපමණද? මේ වන විට ටෙලිකොම් ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම - පෞද්ගලීකරණය- සඳහා ලංසු කැඳවීමක් සිදු කර තිබේද? ප්‍රතිව්‍යුහගත කිරීමට, පෞද්ගලීකරණයට පෙර ටෙලිකොම් ආයතනයේ වත්කම් පිළිබඳ තක්සේරුවක් කර තිබේද? එසේ නම්, එම තක්සේරු වාර්තාව සභාගත කරන්නේ ද? නො එසේ නම්, ඒ මන්ද?

05. රජය සතු මෙම ව්‍යවසායවල පෞද්ගලීකරණ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද? මෙම ක්‍රියාවලිය දූෂණයෙන් හා අනිසි බලපෑම්වලින් තොර බවට රජය සහතික කරන්නේ කෙසේද?

මෙම රජය සතු ව්‍යවසාය පෞද්ගලීකරණය සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සේවක පිරිස, පාරිභෝගිකයන් සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ විශේෂඥයන් ඇතුළු පාර්ශ්වකරුවන් යම්කිසි සංවාදයකට, උපදෙස් ලබා ගන්නට, - consultation - අදහස් ලබා ගන්නට සම්බන්ධ කර ගෙන තිබෙනවාද? එසේ නම්, එම උපදෙස් ලබා ගත් සංවාදශීලී වාර්තා සභාගත කරන්නට කටයුතු කරන්නේද?

06 මෙම රජය සතු ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීමේදී විශේෂයෙන්ම වත්මන් සේවකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය සහ පාරිභෝගිකයන්ට ඇති විය හැකි බලපෑම් ගැන රජය විසින් පුළුල් බලපෑම් තක්සේරුවක් කර තිබේද? අධ්‍යයනයක් කර තිබේද? පෞද්ගලීකරණයෙන්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

පසු රජය සතු මෙම ව්‍යවසායවල සේවකයන්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය ආරක්ෂා කිරීම සඳහා කුමන ප්‍රතිපාදන සලසා තිබේද? ඔවුන්ගේ රැකියා කොන්දේසි හෝ ප්‍රතිලාභවල යම් වෙනසක් සිදු වේද? ඒ පිළිබඳ රජයේ අධ්‍යයන හා නිර්ණයක සභාගත කරන්නේද?

07. මෙම රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණයෙන් ලැබෙන මුදල් ප්‍රයෝජනයට ගන්නා ආකාරය කෙසේද? ඒවා වෙනත් රාජ්‍ය අංශයන්හි නැවත ආයෝජනය කරන්නේද? නැතහොත් රාජ්‍ය ණය අඩු කිරීමට හෝ එදිනෙදා වියදම් පියවා ගැනීමට යොදා ගන්නේද?

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේක තමයි මගේ ප්‍රශ්නය. විශේෂයෙන්ම මෙම ප්‍රශ්නයට පිළිතුරු අපේක්ෂා කරන මේ මොහොතේ මම ඔබතුමාට නැවත සඳහන් කරන්න කැමැතියි, ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව හොඳට හිතට අරගෙන, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී ගත හැකි පරිණතම, දත්ත කේන්ද්‍රීය, විද්‍යාත්මක, ඒ වාගේම සාක්ෂි කේන්ද්‍රීය ප්‍රතිපත්ති, තීන්දු තීරණ ගැනීම වඩාත් යෝග්‍යයි කියන එක. එසේ නොකළහොත් ඔබතුමන්ලාටත් සිදු වන්නේ ඊයේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ලබා දුන් තීන්දුව හා සමාන යම්කිසි තීන්දුවකට යටත් වීමටයි.

ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒවාට අපි ඉදිරි දිනයක සවිස්තරව පිළිතුරු ලබා දෙන්න සූදානමින් ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම, ගරු සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

2023.11.10 දින පාර්ලිමේන්තුවේදී කළ චෝදනා
2023.11.10ஆம் திகதி பாராளுமன்றத்தில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டுக்கள்
ALLEGATIONS MADE IN PARLIAMENT ON 10.11.2023

ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Hon. Speaker, I move,

"That the Question of Privilege arising out of the matter raised by the Hon. Chaminda Wijesiri, M.P. on 14th November, 2023 in Parliament to the effect that his Privileges have been infringed, be referred to the Committee on Ethics and Privileges in terms of the provisions of Standing Order 118 of the Parliament."

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

යොහාන් පතිරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
யொஹான் பதிரண மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
YOHAN PATHIRANA FOUNDATION (INCORPORATION) BILL

ගරු උදයන කිරිඳිගොඩ මහතා
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"යොහාන් පතිරණ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා
(மாண்புமிகு கே.பி.எஸ். குமாரசிறி)
(The Hon. K.P.S. Kumarasiri)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.